# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1658/36 - 2010 ජූනි මස 17 වැනි බ්‍රහස්පතින්දා - 2010.06.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

එල්. ඩී. – බී. 21/78.

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

27 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන අමාත්‍ය, දිසානායක මුදියන්සේලාගේ සුමනවීර බන්ඩා දිසානායක වන මම, මේ නියමය මගින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය ඇතිව, කලින් කල සංශෝධිත රජරට විශ්ව විද්‍යාලය හා සම්බන්ධ වූ 1995 නොවැම්බර් මස 07 වැනි දින හා අංක 896/2 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළවූ නියමය සහ 2009 ජූනි මස 23 වැනි දින අංක 1607/13 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය මගින් අවසන් වරට සංශෝධිත, ඉහත කී පනතේ 21 වැනි වගන්තිය යටතේ සාදන ලද නියමය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඉහත කී නියමයේ (iv) වැනි ඡේදයේ 3 වැනි අයිතමය වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන් :-

"3. කෘෂිකර්ම පීඨය ".

(2) ඉහත කී නියමයේ උපලේඛනයේ I වැනි තීරයේ "කෘෂිකර්ම පීඨය" යන අයිතමය වෙනුවට සහ එහි II වැනි තීරයේ (අධ්‍යයන අංශ) ඊට අනුරූපීව දැක්වෙන සඳහන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

| *"I වැනි තීරය*<br>*පීඨය* | *II වැනි තීරය*<br>*අධ්‍යයන අංශ* |
|---|---|
| කෘෂිකර්ම පීඨය | 1. ශාඛ විද්‍යා අධ්‍යයන අංශය<br>2. කෘෂිකර්ම පද්ධති අධ්‍යයන අංශය<br>3. පාංශු සහ ජලසම්පත් කළමනාකරණ අධ්‍යයන අංශය.". |

දිසානායක මුදියන්සේලාගේ සුමනවීර බන්ඩා දිසානායක,
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2010 ජූනි මස 08 වැනි දින,
කොළඹ,
උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.

07-137/5


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.